යුක්තිය මෙහෙයුමට සමගාමීව ළමා සහ කාන්තා හිංසනය මැඩ පැවැත්වීම උදෙසා කාන්තා පොලිස් නිලධාරිනියන්ගේ සහභාගීත්වයෙන් සිදුවන මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් දිනමිණ පුවත්පත (පෙබරවාරි 19, 2024), එකිනෙකට සමානත්වයක් ඇති පුවත් දෙකක් මුල් පිටුවේම මෙවැනි සිරස්තල සමඟින් ඉදිරිපත් කොට තිබිණි.

* "නුවරඑළිය බසයේ උපාය දූතිකාවට අනංගයා හසුවෙයි"

* "කාන්තා අපයෝජන වළක්වන WPCට බසයේදී අතවර"

1) "අනංගයා" යන්නෙන් බොහෝ විට සංකේතවත් වන්නේ ශෘංගාරය නැතිනම් ප්‍රේමය නොවේද? ඒ අනුව, කාන්තා පොලිස් නිලධාරිනියට ලිංගික අතවර කිරීමට තැත් කළ සැකකරුවෙකු "අනංගයෙකුට" සමාන කිරීම, ලිංගික අතවර වරදක් සැහැල්ලු කොට දැක්වීමක් නොවන්නේ ද?

2) එකම දිනයක, එකම පුවත්පතේ, එක සමාන සිදුවීම් දෙකක් සම්බන්ධව පළ වී ඇති, සමාන පුවත් වාර්තාවන් දෙකක සිරස්තල මේ අයුරින් වෙනස් වී ඇත්තේ මන්ද? මාධ්‍යවේදීන් විසින්ම පෙන්වා දී ඇති පරිදි පුවත් වාර්තාවන්ට සිරස්තල යොදන්නේ එම පුවත් වාර්තා කරනා මාධ්‍යවේදීන් විසින් නොව පුවත් කර්තෘවරයෙකු විසින් වීම එයට හේතුව ද?

ලිංගික අතවරයන් සැහැල්ලු කොට වාර්තා නොකරමු!

